## පටුන


| | | | |
|---|---|---|---|
| 1 | දිස්ත්‍රික් ලේකම්ගේ පණිවුඩය | | 1 |
| 2. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හැදින්වීම | | 2-4 |
| 3 | දිස්ත්‍රික්කය හැදින්වීම | | 4-16 |
| 4 | සංවිධාන සටහන සහ අනුමත සේවක සංඛ්‍යාව | | 17-19 |
| 5 | කාර්ය සාධනය - ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව | | 20-64 |
| | 5.1 | සාමාන්‍ය පරිපාලන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය | 20-31 |
| | 5.2 | සමාජ සේවා සහ සංස්කෘතික ප්‍රගතිය | 31-37 |
| | 5.3 | සංවර්ධන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය | 37-53 |
| | 5.4 | වාර්ෂික ගිණුම් | 54-64 |

# මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 වර්ෂය සඳහා වූ

# කාර්යය සාධන වාර්තාව හා ගිණුම්

## 1 දිස්ත්‍රික් ලේකම්ගේ පණිවුඩය

මාතර දිස්ත්‍රික්කයේ සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම මෙන්ම එමගින් උසස් මට්ටමින් ප්‍රතිලාභ ලබා ගැනීම දිස්ත්‍රික් භාර නිලධාරී වශයෙන් මා විසින් ඉටුකළ යුතු මහඟු මෙහෙවරකි. එම කාර්යයේදී සංවර්ධන ක්‍රියාවලියට මනා දායකත්වයක් ලබා දීම පිළිබඳව වූ ක්‍රියාවලියේදී මහජනතාවට සපයන ලද සේවාවන්හි ප්‍රගතිය කෙසේද යන්නත් 2014 වසර තුල ඉටු කිරීමට බලාපොරොත්තු වන සේවා සැලසුම් කිරීම පිළිබඳව සලකා බැලෙන මෙම වාර්තාවේදී පණිවිඩය ලබා දීමට අවස්ථාව ලැබීම මා අගය කොට සලකමි.

වර්තමාන රජය අඩු ආදායම් ලාභී පවුල් ඉලක්ක කරගෙන ඔවුන්ගේ ජීවන තත්වය නගා සිටුවීම පිණිස දියත් කර ඇති බොහෝ සංවර්ධන ව්‍යාපෘතීන් සහ රජය මගින් සැපයෙන සේවාවන් බොහොමයක් අද වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ජනතාව වෙත ගලා යාමට සලස්වා තිබීම රාජ්‍ය ප්‍රතිපත්ති වල සඳහන් ලක්ෂණයකි. මේ මත ඇති වන කාර්ය සාධනය පිළිබඳ තොරතුරු මහජනතාව වෙත දැනගන්නට සැලැස්වීම තුළින් රාජ්‍ය ප්‍රතිපත්ති හා කළමනාකරණ උපක්‍රම පිළිබඳව මහජන විශ්වාසය තහවුරු වීම තුළින් සංවර්ධන ක්‍රියාවලියට මහජනතාවගේ දායකත්වයන් වර්ධනය කළ හැකිය.

වාර්ෂික අයවැය ලේඛනයට අනුව 2013 වර්ෂය තුළදී ප්‍රතිපාදනය කරන ලද මූල්‍ය සම්පත් උපයෝජනය කර ගැනීමේ ක්‍රියාවලියේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක, ග්‍රාම නිලධාරී කාර්යාල 650 ක සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ඇතුළු රේඛීය අමාත්‍යාංශ වල මූල්‍ය මෙහෙයුම් වල කාර්ය සාධනය මෙම වාර්තාවේ ඇතුලත්ව ඇත.

මෙම වාර්තාව පිළියෙල කිරීමට අවශ්‍ය මග පෙන්වීම ලබා දුන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තුමාටත්, මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරී රංජිත් වීරසේකර මහතාටත්, ගණකාධිකාරී සුනිල් ජයසේකර මහතාටත්, අයවැය සහකාර විජිතා අබේවික්‍රම මහත්මියටත්, ඔවුනට සහය දැක්වූ ගිණුම් අංශයේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියළු දෙනාටත් මාගේ අවංක ස්තූතිය පිරිනමමි.

ඊ.ඒ.සී. විදානගමාච්චි

දිස්ත්‍රික් ලේකම්/ දිසාපති

මාතර

2014.04.22

## 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හැඳින්වීම

### 2.1 දැක්ම

සේවා ලාභීන් තෘප්තිමත් වන පරිදි කාර්යක්ෂම හා සඵලදායී සේවයක් සැපයීම තුලින් විශිෂ්ඨත්වය කරා මාතර දිස්ත්‍රික්කය මෙහෙයවීම.

මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව මානව, භෞතික හා මූල්‍ය සම්පත් උපායශීලීව හසුරුවමින් ජනතා හිතවාදී පරිපාලන යාන්ත්‍රනයක් බිහි කර දිස්ත්‍රික්කයේ තිරසාර සංවර්ධනයක් ඇති කර ලීම.

### 2.2 පරමාර්ථ

- කාර්යක්ෂම හා ඵලදායී දිස්ත්‍රික් පරිපාලන ක්‍රමයක් පවත්වා ගෙන යෑම.
- ජනතා තෘප්තිය ඉහල නැංවෙන ආකාරයෙන් රාජ්‍ය අංශය මගින් කාර්යක්ෂම සේවා සැපයීමක් සහතික කිරීම.
- ප්‍රතිලාභීමුඛ ආකල්ප, වගකීම්, විචක්ෂණශීලී සම්පත් භාවිතය, අපක්ෂපාතීත්වය, විනිවිද භාවය වැනි හර පද්ධතීන් රාජ්‍ය සේවය තුල ස්ථාපිත කිරීම.
- රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයට අදාල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රතිපත්ති වලට අනුකූලවූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක වන විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අධිකාරීන් මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන්, ව්‍යාපෘති සංවිධානය කිරීම, මූල්‍යමය හා මූල්‍යමය නොවන සම්පත් යෙදවීම සහ පසුවිපරම් කටයුතු වල සම්බන්ධීකාරකයා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ ජනතාවගේ සුභසාධනය සහ සංවර්ධනය ඉහළ නැංවීම.
- දිස්ත්‍රික් බල ප්‍රදේශය තුල වෙසෙන ජනතාවගේ විවිධ වූ ආර්ථික, සමාජමය හා සංස්කෘතිකමය අවශ්‍යතාවයන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් ඔස්සේ ඉටු කර දීම.
- දිස්ත්‍රික්කයේ රජයේ නියෝජිතයා වශයෙන් ක්‍රියා කරමින් විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය නොවන සංවිධාන වලට නිවැරදි තීරණ ගැනීම සඳහා නිවැරදි හා නිශ්චිත තොරතුරු ග්‍රාමීය හා ප්‍රාදේශීය මට්ටමින් එක්රැස් කර ඒකාබද්ධ කර සපයා දීම.

❖ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ රජයේ විවිධ දෙපාර්තමේන්තු වෙනුවෙන් දිස්ත්‍රික්කය තුල ඔවුන්ට හිමි ආදායම් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම.

❖ ගං වතුර, සුළි සුළං, නියග, මුහුද ගොඩ ගැලීම් වැනි හදිසි ආපදා අවස්ථාවන්හිදී ජනතාවට අවශ්‍ය ක්ෂණික සහන සේවාවන් සහ ආධාර ලබාදී ඔවුන්ගේ ජීවන තත්වය යථා තත්වයට පත් කිරීම.

## 2.3 කාර්යයන්

❖ දිස්ත්‍රික් ආරක්ෂක කමිටුවේ ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් දිස්ත්‍රික් බල ප්‍රදේශය තුල ජීවත් වන ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට ක්‍රියා කිරීම.

❖ දිස්ත්‍රික්කය තුල සංස්කෘතික, ආගමික හා වෙනත් කාලීන රාජ්‍ය උත්සව සංවිධානය කිරීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම.

❖ විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ ලේකම් වශයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.

❖ දිස්ත්‍රික්කය තුල ප්‍රාදේශීය ලේකම් වරුන් 16 දෙනා සමග ප්‍රාදේශීය පරිපාලන කටයුතු මෙහෙයවීමේ ප්‍රධානියා ලෙස ක්‍රියා කිරීම හා එහි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට ක්‍රියා කිරීම.

❖ පරිපාලන කටයුතු වලදී ඵලදායිතාවය හා ගුණාත්මක භාවය ඉහල නැංවීම සඳහා නවීන තොරතුරු සංනිවේදන තාක්ෂණය යොදා ගැනීම හා ඒ සඳහා කාර්ය මණ්ඩලය උනන්දු කරවීම.

❖ දිස්ත්‍රික් බල ප්‍රදේශය තුල සියළුම අමාත්‍යාංශ හා දෙපාර්මේන්තු වල නියෝජ්‍ය ප්‍රධානියා ලෙස ක්‍රියා කරමින් ඒ ඒ ආයතන වල අරමුණු පරමාර්ථ හා කාර්යයන් ඉටුවන පරිදි සම්බන්ධීකරණ කටයුතු කිරීම.

❖ සියලුම මැතිවරණ කටයුතු වලදී එනම් ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා මැතිවරණය හා පළාත් පාලන මැතිවරණ වලදී මැතිවරණ කොමසාරිස්ගේ නියෝජිතයා වශයෙන් දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ලෙස ක්‍රියා කරමින් සාධාරණ හා අපක්ෂපාතී මැතිවරණ පැවැත්වීමට ක්‍රියා කිරීම.

❖ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ අභිප්‍රේරණ සහ හැකියා වර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

❖ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා මණ්ඩල හා සම්බන්ධ ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙනුවෙන් ඔවුන්ගේ ආදායම් එක්රැස් කිරීම, ගිණුම් ගත කිරීම හා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම සහ අදාල ආදායම් ගණන්දීමේ නිලධාරීන් දැනුවත් කිරීම.

- ❖ මුහුදු ගොඩගැලීම, නියඟ, ගං වතුර, සුළි සුළං වැනි විස්තීර්ණ ආපදා අවස්ථාවන්හිදී රජයේ නියෝජිතයා ලෙස ක්‍රියා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු කිරීම තුලින් ජන ජීවිතය යථා තත්වයට පත් කිරීම හා ස්ථාවර කිරීම.
- ❖ විදේශාධාර ව්‍යාපෘති හා දේශීය අරමුදල් ව්‍යාපෘති සුපරීක්ෂණය හා අධීක්ෂණය මගින් වත්කම් කළමනාකරණ පද්ධති සංවර්ධනය කිරීම.

# 3 දිස්ත්‍රික්කය හැදින්වීම

## 3.1 මාතර දිස්ත්‍රික්කයේ මායිම්

සිහින් දිය දහරාවක් ලෙසින් හරිත නිම්නයන් පසු කරමින් ගලා බස්නා දිය උල්පත්, පහත් බිම් පෝෂණය කරනා සොඳුරු ගංගාවකි මාතර දිස්ත්‍රික්කය. දකුණුලක නිල්වලා නදිය අසබඩ මහ සයුරට මායිම්ව පිහිටි මාතර දිස්ත්‍රික්කය, රෝහන පුරවරයේ ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්ට මැදිව පිහිටා ඇති වර්ග කිලෝමීටර් 1282.5 ක් හෙවත් හෙක්ටයාර් 128,250 ක භූමි ප්‍රමානයක වපසරියකින් යුක්ත සශ්‍රීක වූ ආකර්ශනීය භූමි ප්‍රදේශයකි. උතුරු අක්ෂාංශ අංශක 5.8 ත් 6.4 ත් අතර හා නැගෙනහිර දේශාංශ 80.4 ත් 80.7 ත් අතර පිහිටි මාතර දිස්ත්‍රික්කය මිලි ලීටර් 2553.2 ක සාමාන්‍ය වර්ෂාපතනයකින්ද අංශක 26.7 සාමාන්‍ය උෂ්ණත්වයකින්ද යුක්ත තෙත් කලාපීය දේශගුණයක් සහිත දිස්ත්‍රික්කයකි.

ශ්‍රී ලංකා භූමි ප්‍රමානයෙන් 1.96% ක් අප දිස්ත්‍රික්කය සතුව ඇති අතර, දකුණු පළාතේ භූමි ප්‍රමාණයෙන් 23.14% ක් වශයෙන් මුළු බිම් ප්‍රමානය හැඳින්විය හැකිය. දිස්ත්‍රික්කය දකුණු වෙරළබඩ සිට උතුරේ අඩි 3880 ක් දක්වා (කුකුළුගල 3880) නැගීමක් පෙන්නුම් කරන අතර, උතුරේදී ලෝක උරුමයක් බවට පත්ව ඇති සිංහරාජ වනගහනයෙන් ආකර්ශනීය දියඇළි වලින් සමන්විත වේ.

දකුණින් දර්ශනීය මුහුදු තීරයකින්ද, උතුරින් රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න, කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් ද, බටහිරින් ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදූව, ඉමදූව, යක්කලමුල්ල, තවලම නෙළුව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් ද, නැගෙනහිරින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඕකේවෙල, බෙලිඅත්ත, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්ගෙන් ද මායිම්ව මාතර දිස්ත්‍රික්කය පිහිටා තිබේ.

මාතර දිස්ත්‍රික්කයට අයත් දොඩම්පහල සිට මිදිගම දක්වා විහිදී තිබෙන දර්ශනීය වෙරළ තීරයෙහි දිග කි.මී. 55 කි. නැගෙනහිර සිට බටහිරට සාමාන්‍ය පළල කි.මී. 35 කි. මෙම වෙරළෙන් 85% ක් පමණ නිරිතදිග මෝසම් සුළං හමන රටාවට ලම්භාකාරව පිහිටා ඇත. මාතර දිස්ත්‍රික්කය ආශ්‍රිත මහාද්වීපික තටාකයේ පළල කි.මී. 7 ක් පමණ වේ. මේ හැරුණු විට දකුණේ සිට රට අභ්‍යන්තරයට සිංහරාජ අඩවිය දක්වා කි.මී. 64 ක පමණ විහිදීමක් ඇත.

මාතර දිස්ත්‍රික්කය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16 කින් සමන්විත වන අතර, ග්‍රාම නිලධාරී කොට්ඨාශ 650 කට බෙදා වෙන් කර ඇත.


මාතර දිස්ත්‍රික්කය පිහිටීම
ශ්‍රී ලංකාව
මාතර
රත්නපුර දිස්ත්‍රික්කය
කොටපොල
පස්ගොඩ
පිටබැද්දර
මුලටියන
හම්බන්තොට දිස්ත්‍රික්කය
අකුරැස්ස
අතුරලිය
හක්මන
ගාල්ල දිස්ත්‍රික්කය
කඹුරුපිටිය
කිරින්ද පුහුල්වැල්ල
මාලිම්බඩ
වැලිපිටිය
තිහගොඩ
දෙවිනුවර
දික්වැල්ල
වැලිගම
මාතර
ඉන්දියන් සාගරය
මූලාශ්‍රය : සංඛ්‍යාලේඛන අංශය, මාතර
සිතියම් පරිමාණය 1:300,000
0 1.252.5 5 7.5 10 කිලෝ මීටර්

### 3.1.1 මාතර දිස්ත්‍රික්කයේ ඓතිහාසික වැදගත්කම

ඓතිහාසික රාවනා යුගය තෙක් දිවෙන ඉතිහාසයකට උරුමකම් කියන සුන්දර නිල්වලා නදියෙහි පහස ලබන මාතර පුරවරය, කුලවතුන්ගේ මගධය ද, ධනවතුන්ගේ බෙංගාලය ද, උගතුන්ගේ තක්සලාව ද වශයෙන් සිංහල මහා වංශයේ මැද යුගයේ කතුවරයා විසින් හඳුන්වා දෙන්නේ මහත් ගෞරවයෙනි. මාතර පුරවරය දේශමාමකත්වයෙන්, ජාතිවාත්සල්‍යයෙන්, ආගමික භක්තියෙන් පිරිපුන් වූ උදාරතර ජන කොටසකගේ නිජබිම බව පැහැදිලි වේ.

උගතුන්ගේ, දේශාටකයින්ගේ, කවීන්ගේ ඉමහත් ප්‍රසාදයට හා විමසුමට ලක්වූ ඉතිහාසයේ "මාතොට" නමින් හැඳින්වූ නගරය පසුව "මහතොට" වී මාතර යනුවෙන් ජනවහරට එක් විය. දඹදෙණි රාජ්‍ය සමයෙහි මාතර පාලකයා වූ වීරබා මාපාණන් මාතර විශාල පටුනක් ගොඩනගා මාපාපටුන යැයි නම් තබන ලද බව දැක්වේ. එකල සදෙස් කතුවන් සිය කවි ඇසින් අසිරිය මැනීමේදී මේ බව සනාථ කරවයි. පරෙවි සංදේශ කතුවරයා "මාපාපටුන දැක යාගත් නොවී පමා" ආදී වශයෙන් සඳහන් කරමින් ඒ බව හුවා දක්වයි. නිල්වලා නදියේ වම්පස සමුද්‍ර තීරය "මාතොට" නමින්ද දකුණුපස "මාතොටගම" යනුවෙන්ද හැඳින්වූ බව ද "බල මඳැතුන් මාතොට ඇත්හලේ නිලේයා" යන වැකියෙන් විස්තර වේ.

විජයාවතරණයට පෙර පටන් මාතර නාග ගෝත්‍රික බලය පැවති පෙදෙසක් බවට පුරා විද්‍යාත්මක සාක්ෂි ඇසුරෙන් තහවුරු වී ඇත. එකළ රුහුණට පලා ගිය මුටසීව රජු, මහානාම කුමරු ආදිම නාග වංශිකයා බවට පෙන්නුම් කර ඇත. දැනට ව්‍යවහාරයේ පවතින නාවිමන, නාදුගල, නායිම්බල, නාඹටුන්න, නරවැල්පිට නමින් වූ ගම් වලද නාග ගෝත්‍රිකයින් වාසය කළ බව ඉතිහාසයේ සඳහන් වේ.

වැලිගම ප්‍රදේශයේ පිහිටි කප්පරතොට විදේශිකයින් වෙළඳ යාත්‍රා නැංගුරම්ලා සිටි කොටසක් වශයෙන්ද වැලිගම අග්‍රබෝධි විහාරය දේවානම් පියතිස්ස රජ සමයේ කරවන ලද්දක් බවද සඳහන් වේ. මාතර නගරයේ පිහිටි හත්බෝධි වත්ත හා මාතර බෝධිය කුමාරදාස රාජ්‍ය සමයේ ගොඩනගන ලද්දක් වේ. මේ අයුරින් බලන කල මාතර පුරවරයට මහත් අභිමානවත් ඉතිහාසයක් ඇත.

### 3.1.2 මාතර දිස්ත්‍රික්කයේ ස්වාභාවික සම්පත්

දිස්ත්‍රික්කයේ භූමි පිහිටීම සලකා බලන කල 10% ත් 20% ත් අතර බිම් ප්‍රමානයක් මීටර් 300 – 750 ත් අතර බෑවුම් සහිත පිහිටි කඳු ප්‍රදේශ වේ. දිස්ත්‍රික්කයේ පාංශු ලක්ෂණ සලකා බලන කල වැඩි කොටසක් රතු කහ මිශ්‍ර පොඩිසොලික් පසෙන් නිර්මානය වී ඇත. මෙම පසෙහි ප්‍රධාන ගති ලක්ෂණය වනුයේ ගැඹුරට පිහිටි තෙතමනය සහිත සාරවත් භාවයයි. දිස්ත්‍රික්කයේ පිහිටි සෞම්‍ය දේශගුණික තත්වය පරිසර හිතකාමී වේ. වාර්ෂිකව සාමාන්‍ය වශයෙන් මි.මී. 2500 ක පමණ වර්ෂාපතනයක් ලැබෙන අතර සාමාන්‍ය උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක 26.7 ක් පමණ වේ.

ඍෂ්ඨීය ජල මාර්ග වශයෙන් ගංගා, ඇළදොළ, වැව්අමුණු දිස්ත්‍රික්කයේ දක්නට ලැබෙන අතර, ප්‍රධාන ජල සම්පත වනුයේ නිල්වලා නදියයි. වැලිගම පොල්අතු මෝදරින් මුහුදට ගමන් කරන පොල්වත්ත ගඟද විශාල පෝෂක ප්‍රදේශයක් හිමිකර ගනී. පිරිසිදු ජලය කොටපොල, පස්ගොඩ, පිටබැද්දර වැනි කඳුකර ප්‍රදේශයන් ලබා ඇති දායාදයකි. ප්‍රධාන වැව් 6 ක් ද අමුණු 7 ක් පමණද දිස්ත්‍රික්කයේ විශාල වාරිමාර්ග වශයෙන් කෘෂිකර්ම කටයුතු සඳහා ජලය සපයනු ලැබේ.

ජාතික ධනයට දායකත්වය ලබා දෙන දිස්ත්‍රික්කයේ ඛණිජ සම්පත් අතරින් වටිනාම සම්පත මැණික් වේ. දිස්ත්‍රික්කයේ තවත් ඛණිජ සම්පතක් වශයෙන් කළුගල් හැඳින්විය හැකිය.

දිස්ත්‍රික්කයේ ස්වාභාවික සම්පත් අතර ප්‍රධානත්වයේ ලා සැලකෙනුයේ වනාන්තරයි. මෙම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ප්‍රධාන වනාන්තරය වූ සිංහරාජය ස්වභාව ධර්මයේ අපූර්වතම නිර්මානයකි. ගාල්ල, මාතර හා රත්නපුර දිස්ත්‍රික්ක තුනෙහි හෙක්ටයාර 11,187 ක් පුරා ව්‍යාප්තව පවත්නා සිංහරාජය 1989 දී "ලෝක උරුම" භූමියක් ලෙස නම් කරන ලද, ශ්‍රී ලංකාවේ ප්‍රථම ස්වාභාවික සම්පතයි. රක්වාන කඳුබෑවුම් සහ නිම්න ඔස්සේ පැතිරී ඇති මෙම වනාන්තරයේ උසම ස්ථානය මුහුදු මට්ටමේ සිට මීටර් 1,170 ක් වන හීනපිටිගල කඳු මුදුනයි. අවම උස මීටර් 90 කි. ජලාධාර ප්‍රදේශයක් ලෙසද සිංහරාජය වඩාත් වැදගත් වේ. ගිං ගඟ හා කළු ගඟෙහි ප්‍රධාන ශාඛාවන් ඇරඹෙන්නේ සිංහරාජ වනයෙනි. මාතර දිස්ත්‍රික්කයේ වනාන්තර බිම් ප්‍රමාණය 2011 වසරේදී හෙක්ටයාර් 21,203.1 කි. ඉන් රක්ෂිත වනාන්තර බිම් ප්‍රමානය හෙක්ටයාර් 18,152 කි. අවශේෂ වනාන්තර බිම් ප්‍රමානය හෙක්ටයාර් 3,051.1 කි.

ශ්‍රී ලංකාව වටා පිහිටි ඉන්දියන් සාගරය හා ඒ ආශ්‍රිත වෙරළ කළාපය අප ලද තවත් වටිනා ස්වාභාවික සම්පතකි. ශ්‍රී ලංකාව වටා පිහිටි කිලෝමීටර් 1600 ක් පමණ වන වෙරළ තීරයෙන් කිලෝමීටර් 55 ක් පමණ මාතර දිස්ත්‍රික්කය සතුව ඇත. වෙරළාශ්‍රිතව පිහිටි බොකු, කලපු, වැලිවැටි, ලවණ සහිත වගුරු බිම්, තෙත් බිම් හා විශේෂයෙන් කඩොලාන ස්වාභාවික සම්පත් වේ. වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුහුදු බොකු පිහිටා ඇති අතර දෙවිනුවර, ගන්දර සුළු වශයෙන් කලපු පිහිටා තිබේ. කඩොලාන මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර දෙවිනුවර, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාශයන්හිද සුළු වශයෙන් ඇත. මාතර දිස්ත්‍රික්කයේ වෙරළ ආශ්‍රිතව නිර්මාණය වී ඇති කඩොලාන හෙක්ටයාර 6 ක පමණ වපසරියක ව්‍යාප්තව පවතී. මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කිරල කැලය මේ අතරින් ප්‍රධානත්වයේලා සැලකිය හැකිය.

කඩොලාන ශාක පද්ධතියේ ප්‍රමුඛස්ථානයක් ලබා ගන්නා කිරල, කෙටල හා කුඹුක් මෙහි වැඩි වශයෙන් දක්නට ඇත. මේ හැර නිල්මොණරුස්ස, නිදිකුම්බා, තුත්තිරි, ගඳපාන, උඳුපියලිය හා බෝවිටියා කැරන්කොකු ආදී ජලාශ්‍රිත ශාකද දක්නට ඇත. සාමාන්‍යයෙන් දක්නට ලැබෙන පඳුරු ශාක වශයෙන් කීකිරිදිය, මොණරකුඩුම්බි, හුලංකීරිය, ගිරිතිල්ල, බිම් කඹුරු ආදිය සැලකිය හැකිය. මාදන්, ජේර, මසන්, කිරල, අඹ ආදී පළතුරුද දක්නට ලැබේ. මෙම පරිසර පද්ධතිය තුළ හෙළ ඔසු සඳහා අවශ්‍ය විරල ගණයේ ශාක වර්ගද පවතී.

කිරල කැලය ආශ්‍රිතව ජෛව විවිධත්වය සලකා බලන කල පක්ෂීන්, උරගයන්, සමනළයින්, උභයජීවීන් හා මත්ස්‍යයින් දක්නට ලැබෙන අතර ප්‍රදේශයට ආවේනික ලක්ෂණ සහිත ජීවීන්ද ඇත. ප්‍රදේශයේ දක්නට ලැබෙන කුරුළු රජදහන තුළ මලිති, බටිති කුරුල්ලන් පිළිහුඩුවන් හා කොබෙයියන් වැඩි වශයෙන් දක්නට ලැබේ. මෙහි කුරුළු විශේෂ 68 ක් පමණ වාසය කරන අතර, දුලබ වර්ගයේ සමනළ වර්ග රාශියක්ද දක්නට ඇත. මෙම ප්‍රදේශයේ එක් කොටසක් සමනළ පුරයක් වශයෙන් හැඳින්වේ. එසේම වගුරු බිම් සහිත ඇළ පද්ධතියේ විවිධ මත්ස්‍ය වර්ග ඇත.

මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි පිහිටි සෞන්දර්යාත්මක ස්ථාන

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ස්වාභාවික සම්පත් හා පිහිටි ස්ථානය |
|---|---|
| පිටබැද්දර | අතුඇල පාලම - නිල්ඇල්ල, මොරවක |
| කොටපොල | සිංහරාජ වනාන්තරය |
| | සත්මහල් ඇල්ල - දෙනියාය |
| | තිරුවාන ගඟ ඇල්ල - කොටපොල |
| දික්වැල්ල | හුම්මානය |
| අකුරැස්ස | දෙදියගල ඇල්ල |
| වැලිගම | රිටිපන්න ධීවර කර්මාන්තය |
| | මිරිස්ස පෙම් උයන්වත්ත |
| | රාස්ස මූණු කූඩුව |
| | මහ නැවියා පොකුණ |
| | මිරිස්ස ධීවර වරාය |
| | ගිරාගල |
| දෙවිනුවර | දෙවිනුවර ප්‍රදීපාගාරය |
| තිහගොඩ | කිරල කැලේ කුරුළු අභය භූමිය |
| | මැද උයන්ගොඩ කුරුළු උයන |
| පස්ගොඩ | ඉලුක්තැන්න ආරන්‍ය රක්ෂිත වනය |
| | මැකිලියතැන්න උමං දොල |
| | ඌරුබොක්ක ඔය |
| | රම්මලේ කන්ද |
| | බිසෝ ඇල්ල |
| කඹුරුපිටිය | ලේන බටුව වැව |

මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන අංශය මාතර

## 3.1.3 දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවනෝපාය ක්‍රම සහ ප්‍රධාන වෙළඳ හා ආර්ථික ක්‍රියාකාරකම්

පුරාතනයේ මාතර දිස්ත්‍රික්කය සමෘද්ධිමත් ශිෂ්ඨාචාරයකට මෙන්ම ස්වයංපෝෂිත ආර්ථික පසුබිමකටද උරුමකම් ලැබූ සශ්‍රීක ප්‍රදේශයක් වශයෙන් ඉතිහාසය පෙන්වා දී ඇත. වර්තමානයේ භූමි පරිභෝජනයේ ප්‍රමුඛත්වය හිමි වන්නේ වතු වගාවන්ටයි. ඒ අතරින් ආංශික සංවර්ධනයක් වශයෙන් කැපී පෙනෙනුයේ ප්‍රධාන ආර්ථික භෝගයක් වූ තේ වගාව හා ඊට අනුගාමීව ස්ථානගතවී ඇති තේ කර්මාන්ත ශාලාය.

මේ හැරුණුවිට මුළු දිස්ත්‍රික්කයේම භූමි පරිභෝජන රටාව අනුව සලකා බලන කල තේ වගාවට විශේෂිත ස්ථානයක් හිමිව ඇත.

ඉඩම් පරිහරණ රටාව සලකා බැලීමේදී වගාවන්හි පැතිරීම් රටාව කෙසේද යන්න අවබෝධ වනු ඇත. පහත වගුව තුලින් ඒ බව පැහැදිලි වේ.

මාතර දිස්ත්‍රික්කයේ ඉඩම් පරිහරණ රටාව 2012 වර්ෂය

| විස්තරය | භූමි ප්‍රමාණය (හෙක්ටයාර්) | ප්‍රතිශතය |
|---|---|---|
| 1 අස්වද්දන ලද කුඹුරු<br>වාරිමාර්ග<br>අහස් දිය | <br>7726.7<br>10701 | <br>6.02<br>8.34 |
| 2 තේ | 23704.2 | 18.48 |
| 3 රබර් | 3732.9 | 2.91 |
| 4 පොල් | 14398.2 | 11.23 |
| 5 කුරුඳු | 7831.5 | 6.11 |
| 6 වෙනත් වගාවන් | 9882.1 | 7.71 |

මූලාශ්‍රය - සංඛ්‍යාලේඛන අංශය මාතර

2011/2012 වගා වර්ෂ වල වී වගාවේ වපුරන ලද මුළු බිම් ප්‍රමානය හෙක්ටයාර් 15116.9 ක් වන අතර, කපා ගන්නා ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර් 15089.2 කි.

ප්‍රධාන වශයෙන් තේ වගාවේ ඉදිරියෙන්ම සිටින දිස්ත්‍රික්ක 08 අතුරින් මාතර දිස්ත්‍රික්කය තුන්වන ස්ථානය ලබා ඇත. මාතර දිස්ත්‍රික්කයේ ප්රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ක් ආවරණය කරමින් ග්‍රාම නිලධාරී වසම් 345 ක තේ වගාව විසිරී ඇත. වතු වගා භෝග අතරින් හෙක්. 25417 ක බිම් ප්‍රමාණයක් උරුම කරගෙන තේ වගාව ඉදිරියෙන් සිටී. කොටපොල, පස්ගොඩ, මුලටියන, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි අවම පුමිතිරි අනුපාතය දෙස බැලුවද, අවම විරැකියාව දෙස බැලුවද, සමාජ පසුබිම දෙස බැලුවද මෙම කරුණ සනාථ වේ. ලබාදෙන සහනාධාරද උපයෝගී කර ගනිමින් දිස්ත්‍රික්කයේ උතුරු ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය බවට තේ වගාව පත් කරගෙන ඇත. කුඩා තේවතු හිමියන්ගේ ශ්‍රම දායකත්වය තුලින් මූල්‍යමය ලාභදායී බවක් ඇති වන බැවින් ඒ සඳහා ජනතාවගේ නැඹුරුවක් පෙන්නුම් කරයි.

පොල් වගාව දිස්ත්‍රික්කයේ වෙරළබඩ ප්‍රදේශයන්හි දක්නට ඇති අතර ඉන් 75% ක් පමණ කුඩා ඉඩම් හිමියන් සතුය. සාපේක්ෂ වශයෙන් පොල් වගාව සඳහා අවශ්‍ය මූලික ධනය, ශ්‍රම සහභාගීත්වය අවම බැවින් ගැමි ජනතාවද මීට නැඹුරු විය. එහෙත් දිස්ත්‍රික්කයේ දැනට සිදුවන පොල් ඉඩම් බෙදා නිවාස සෑදීම සහ සංවර්ධන කටයුතු වලට යොදා ගැනීම නිසා බිම් ප්‍රමාණයේ වැඩිවීමක් සිදුවී නැත. එමෙන්ම 2011, 2012 සහ 2013 වර්ෂ වල මාතර දිස්ත්‍රික්කයේ වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය හේතුවෙන් කපා ඉවත් කළ පොල් ගස් ගණන 187358 කි. එම හේතුවෙන් මාතර දිස්ත්‍රික්කයේ පොල් වගාවට මහත් තර්ජනයක් එල්ලවී ඇත.

රබර් වගාව හා ඒ ආශ්‍රිත කර්මාන්තද සුළු වශයෙන් දක්නට ලැබේ. මේ හැරුණු විට මුළු දිස්ත්‍රික්කයේම සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම භූමි පරිභෝජන රටාව අනුව සලකා බලන කල වී වගාව දක්නට ලැබේ. දිස්ත්‍රික්කයේ 2011/ 2012 මහ කන්නයේ හෙක්ටයාර් 15196 ක් ද 2012 යල කන්නය සඳහා හෙක්ටයාර් 12476 ක් ද වශයෙන් 2012 වගා වර්ෂය සඳහා හෙක්ටයාර් 27672 ක් වගා කෙරින. අපනයන භෝග වගාවද දිස්ත්‍රික්කය පුරා විසිරී ඇති අතර, කුරුඳු බිම් ප්‍රමානය හෙක්. 7,713.6 ක් පමණ වේ. කුරුඳු වගාවෙන් මුලටියන, කඹුරුපිටිය, හක්මන, පස්ගොඩ, අකුරැස්ස, වැලිපිටිය වැනි ප්‍රදේශයන්හි ජනතාව තම ආර්ථිකය සවිමත් කර ගත් අතර, ශ්‍රී ලංකාවේ කුරුඳු අපනයන කරන්නන්ගේ කැපී පෙනෙන ව්‍යවසායකයින් දැනට මාතර දිස්ත්‍රික්කයෙන් බිහිවී ඇත. දිවයිනේ කුරුඳු වගා බිම් ප්‍රමානයෙන් 30% මාතර දිස්ත්‍රක්කය සතුව ඇත.

මේ හැර ගම්මිරිස්, කෝපි, පුවක් වගාවන්ද දක්නට ඇත. දිස්තික්කයේ එළවළු හා පළතුරු වගාව පාරම්පරිකව, ගතානුගතිකව, ආදිකාලීනව  සිදුවූ ආකාරයට ගෙවතු වගාවන් වශයෙන් දැනටද සිදු කෙරේ. වැලිපිටිය, හක්මන, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ එළවළු වගාවේ ප්‍රමුඛස්ථානයක් ගනී.

මාතර දිස්ත්‍රික්කයේ කෘෂි ආර්ථිකය මත පදනම් වූ කර්මාන්ත ප්‍රමුඛස්ථානයේලා සැලකිය හැකිය. ඒ අතරින් තේ කර්මාන්තය ප්‍රධාන වේ. මාතර දිස්ත්‍රික්කයේ තේ කර්මාන්ත ශාලා 89 ක් වන අතර මෙමගින් කර්මාන්ත ක්ෂේත්‍රයේ රැකියා සැපයීම වැඩි වශයෙන් දක්නට ලැබේ. එසේම සේවකයින් 20 ට වැඩි කර්මාන්ත අතරින් ඇඟළුම් කර්මාන්ත කිහිපයක්, ලෝඩ්ස්ටාර් ටයර් කර්මාන්ත ශාලාව, ලකී යෝගට් ආයතනය දක්නට ලැබේ. මෙම කර්මාන්ත අතුරින් රැකියා නියුක්තිය වැඩි ප්‍රතිශතයක් දක්නට ලැබෙනුයේ ආහාර නිෂ්පාදනය හා සැකසීම, රෙදිපිළි ආශ්‍රිත කර්මාන්ත, කොහු හා බට ආශ්‍රිත කර්මාන්ත මෙන්ම මැටි ආශ්‍රිත නිෂ්පාදනයන්ය.

2003 කර්මාන්ත සංගණන වාර්තා අනුව මාතර දිස්ත්‍රික්කයේ සේවකයින් 9 ට අඩු කර්මාන්ත ඒකක සංඛ්‍යාව 5033 ක් වූ අතර එහි සේවක සංඛ්‍යාව 10455 ක් විය. සේවක සංඛ්‍යාව 10 ට වැඩි කර්මාන්ත ඒකක 273 ක් පිහිටා තිබූ අතර එම කර්මාන්තයන්හි සේවක සංඛ්‍යාව 10416 කි. මේ අනුව ගෘහ කර්මාන්ත හැරුණුවිට කර්මාන්ත ඒකක 5306 ක මුළු සේවක සංඛ්‍යාව 28871 ක් සේවයේ යෙදී සිටි බව පෙනේ. මාතර දිස්ත්‍රික්කයේ ශ්‍රම බලකායෙන් 22.9%  ක් කර්මාන්ත අංශයේ සේවයේ යෙදී ඇත.

මාතර දිස්ත්‍රික්කයේ දික්වැල්ල, දෙවිනුවර, වැලිගම හා මාතර ග්‍රාම නිලධාරී වසම් 56 ක ගම් 86 ක ධිවර කර්මාන්තයේ නියැලුනු ජනතාව එම ප්‍රදේශයේ මුළු ජනතාවගෙන් 48% ක් පමණ වේ. 2004 සුනාමි ඛේදවාචකයෙන් පසු යලි යතා තත්වයට පත් ධීවර කර්මාන්තයේ 2012 වසරේ නිෂ්පාදනය මෙ.ටොන් 50343 ක් විය.

### 3.1.4 දිස්ත්‍රික්කයේ වාරිමාර්ග පද්ධතිය

මාතර දිස්ත්‍රික්කයේ වාරිමාර්ග කටයුතු පිළිබඳ සලකා බැලීමේදී 2012 වර්ෂයේ සංඛ්‍යාලේඛන අනුව විශාල වාරිමාර්ග වැව් 6 ක් සහ අමුණු 7 ක් ද, සුළු වාරිමාර්ග වැව් 24 ක් සහ අමුණු 131 ක් දක්නට ලැබේ.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව වාරිමාර්ග - 2012

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | විශාල වාරිමාර්ග | | සුළු වාරිමාර්ග | |
|---|---|---|---|---|
| | වැව් | අමුණු | වැව් | අමුණු |
| අකුරැස්ස | | 2 | 1 | 33 |
| අතුරලිය | | | 3 | 2 |
| දෙවිනුවර | | | | 2 |
| දික්වැල්ල | 1 | | 3 | |
| හක්මන | 3 | | 7 | 13 |
| කඹුරුපිටිය | 1 | 2 | | 7 |
| කිරින්ද පුහුල්වැල්ල | | | | 8 |
| කොටපොල | | | | 8 |
| මාලිම්බඩ | | | 2 | 4 |
| මාතර | 1 | | 3 | 4 |
| මුලටියන | | | | 10 |
| පස්ගොඩ | | | 1 | 10 |
| පිටබැද්දර | | | | 1 |
| තිහගොඩ | | 3 | | 8 |
| වැලිගම | | | 1 | 4 |
| වැලිපිටිය | | | 3 | 17 |
| මාතර දිස්ත්‍රික්කය | 6 | 7 | 24 | 131 |

මූලාශ්‍රය : සංඛ්‍යාලේඛන අංශය, මාතර

දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ තොරතුරු අනුව වැව් යටතේ වගා කරණ බිම් ප්‍රමාණය හෙක්. 3719 ක් සහ ගොවීන් සංඛ්‍යාව 3851 කි. අමුණු යටතේ වගා කරන බිම් ප්‍රමාණය හෙක්. 6573 ක් සහ ගොවීන් සංඛ්‍යාව 6298 කි.

### 3.1.5 මාතර දිස්ත්‍රික්කයේ ජනගහන තොරතුරු

මෑත කාලීන සංගණන වර්ෂ 6 ක ස්ත්‍රී පුරුෂ භාවය අනුව මාතර දිස්ත්‍රික්කයේ ජනගහනය (1953 – 2012 දහස් ගණනින්) පහත සඳහන් වගුවෙන් හා ප්‍රස්ථාර සටහනෙන් නිරූපනය වේ. ඒ අනුව පෙනී යන්නේ මාතර දිස්ත්‍රික්කයේ පුරුෂ ජනගහනයට වඩා ස්ත්‍රී ජනගහනයෙහි වැඩි වීමත් සමස්ථයක් ලෙස මුළු ජනගහනයෙහි වැඩි වීමකි.

ජනගහනය (දහස්)

| සංගණන වර්ෂය | මුළු ජනගහනය | පුරුෂ | | ස්ත්‍රී | |
|---|---|---|---|---|---|
| | | ගණන | ප්‍රතිශතය | ගණන | ප්‍රතිශතය |
| 1953 | 413.4 | 208.4 | 50.4 | 205 | 49.6 |
| 1963 | 514.9 | 255.5 | 49.6 | 259.4 | 50.4 |
| 1971 | 586.4 | 289.5 | 49.4 | 296.9 | 50.6 |
| 1981 | 643.8 | 312.2 | 48.5 | 331.6 | 51.5 |
| 2001 | 761.4 | 367.7 | 48.3 | 393.7 | 51.7 |
| 2012 | 809.3 | 388.6 | 47.9 | 420.7 | 52.1 |

මූලාශ්‍රය . ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව



## අංශ හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව ඇස්තමේන්තු ජනගහනය - 2012

| අංශය | මුළු ගණන | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| නාගරික | 96,063 | 46,029 | 50,034 |
| ග්‍රාමීය | 690,734 | 331,374 | 359,360 |
| වතු | 22,547 | 11,201 | 11,346 |
| එකතුව | 809,344 | 388,604 | 420,740 |

මූලාශ්‍රය . සංඛ්‍යාලේඛන අංශය මාතර






### 3.1.6 මාසික වර්ෂාපතන රටාව 2012 වර්ෂය

මාතර දිස්ත්‍රික්කයේ වර්ෂාපතන රටාවන් වෙනස් වන ආකාරය පහත දැක්වේ.

| මාසය | කැකනදුර වර්ෂාපතනය (මිලි මීටර්) | දෙනියාය වර්ෂාපතනය (මිලි මීටර්) |
|---|---|---|
| වාර්ෂික වර්ෂාපතනය | 1688.4 | 3474.7 |
| ජනවාරි | 15.4 | 78.4 |
| පෙබරවාරි | 130.3 | 140.4 |
| මාර්තු | 125.9 | 288.6 |
| අප්‍රේල් | 71.8 | 527.7 |
| මැයි | 66.7 | 154.6 |
| ජුනි | 55.2 | 146.0 |
| ජූලි | 53.4 | 133.3 |
| අගෝස්තු | 277.0 | 300.5 |
| සැප්තැම්බර් | 217.4 | 229.4 |
| ඔක්තෝබර් | 234.3 | 474.4 |
| නොවැම්බර් | 276.0 | 792.2 |
| දෙසැම්බර් | 165.0 | 209.2 |

මූලාශ්‍ර - තෘණ සම්පත් හා විමර්ශන මධ්‍යස්ථානය, කැකනදුර

තේ පර්යේෂණ ආයතනය, දෙනියාය

මාතර දිස්ත්‍රික්කයෙහි පිටබැද්දර, කොටපොල, පස්ගොඩ වැනි කඳුකර ප්‍රදේශයන්හි ඉහල වර්ෂාපතනයක් සහිත තෙත් කාලගුණයක්ද, මාතර, දික්වැල්ල, දෙවිනුවර වැනි මුහුදුබඩ ප්‍රදේශයන්හි අඩු වර්ෂාපතනයක් සහිත වියළි කාලගුණයක්ද පවතී. කඳුකර ප්‍රදේශයේ වර්ෂාපතනය මුහුදු බඩ ප්‍රදේශයේ මෙන් දෙගුණයක් වී ඇත.

## 3.2 මූලික තොරතුරු - මාතර දිස්ත්‍රික්කය

- දිස්ත්‍රික්කය : මාතර
- පළාත : දකුණ
- මුළු බිම් ප්‍රමාණය : වර්ග කිලෝමීටර් 1282.5
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන : 16
- ග්‍රාම නිලධාරී කොට්ඨාශ ගණන : 650
- ගම් ගණන : 1658
- ජන්ද කොට්ඨාශ ගණන : 07
- මහ නගර සභා ගණන : 01
- නගර සභා ගණන : 01
- ප්‍රාදේශීය සභා ගණන : 15
- සංචාරක බංගලා ගණන : 01 (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය)
- කලාප අධ්‍යාපන කාර්යාල ගණන : 04
- පාසල් ගණන : 359
- ගුරුවරු ගණන : 10035
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගණන : 08
- පළාත් සභා මන්ත්‍රීවරුන් ගණන : 18
- පළාත් පාලන ආයතන මන්ත්‍රී වරුන් ගණන : 193
- ජනගහනය : 809344
- නිවාස ගණන : 203570

## 4 සංවිධාන සටහන සහ අනුමත සේවක සංඛ්‍යාව

### 4.1 සංවිධාන ව්‍යුහය

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අරමුණු මුදුන් පමුණුවා ගත හැකි ආකාරයට වගකීම් හා කාර්යයන් නිසි අයුරින් ඉටු කිරීමට හැකි වන පරිදි 262 වැය ශීර්ෂය යටතේ මෙහෙයුම් වැඩසටහන ක්‍රියාත්මක වේ. එම වැඩසටහන යටතේ ව්‍යාපෘති දෙකකි.

262 මෙහෙයුම් වැඩසටහන

ව්‍යාපෘතිය 1 - සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ව්‍යාපෘතිය 2 - ප්‍රාදේශීය ලේකම් කාර්යාල

මෙහෙයුම් වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවිධාන ව්‍යුහය සකස් කිරීමේදී 262 වැය ශීර්ෂය යටතේ සිටින කාර්ය මණ්ඩලය පමණක් නොව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුල ඇති වෙනත් දෙපාර්තමේන්තු වල දිස්ත්‍රික් කාර්යාලීය නිලධාරී මණ්ඩලයද ඇතුලත් කිරීමට සිදුවී ඇත. එයට හේතුව පොදු මහජනතාවගේ ආර්ථික සමාජීය හා සංස්කෘතික අවශ්‍යතාවයන් එකම වහලක් යටින් පහසුවෙන් හා කාර්යක්ෂමව ඉටුකර දීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුලම ස්ථානගත කර ඇති බැවිනි. දිස්ත්‍රික් බල ප්‍රදේශය තුල එම දිස්ත්‍රික් කාර්යාල වල ප්‍රධානියා ලෙසද දිස්ත්‍රික් ලේකම් කටයුතු කරනු ලැබේ.

උදා - සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, මෝටර් රථ දෙපාර්තමේන්තුව ආදී වශයෙනි.

සංවිධාන සටහන



## 4.2 අනුමත සේවක සංඛ්‍යාව

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි 2013.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය, අතිරික්ත හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදිය.

| කාණ්ඩය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | | | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 | | |
|---|---|---|---|---|---|---|
| | අනුමත සේවක සංඛ්‍යාව | අතිරික්ත | පුරප්පාඩු | අනුමත සේවක සංඛ්‍යාව | අතිරික්ත | පුරප්පාඩු |
| ජ්‍යේෂ්ඨ මට්ටම | 1 | - | - | - | - | - |
| තෘතීය මට්ටම | 8 | - | - | 80 | - | 10 |
| ද්විතීය මට්ටම | 37 | 25 | - | 1124 | - | 160 |
| ප්‍රාථමික මට්ටම | 12 | 3 | - | 128 | - | 1 |
| වෙනත් (අනියම් / ආදේශක) | 1 | - | 1 | 5 | - | 4 |
| මුළු එකතුව | 59 | 28 | 1 | 1337 | - | 175 |

# 5 ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව කරන ලද කාර්යයන්

## 5.1 සාමනාය පරිපාලන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය

### 5.1.1 ග්‍රාම නිලධාරී ක්‍රියාකාරකම්

මාතර දිස්ත්‍රික්කය තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි ග්‍රාම නිලධාරී වසම් 650 ඇත. 2013 වර්ෂයේ ග්‍රාම නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව 219 කි. ග්‍රාම නිලධාරීන් සම්බන්ධව සියලුම ආයතනික රාජකාරි සහ ජීවදත්ත තොරතුරු පද්ධති පවත්වාගෙන යාම කරනු ලබන්නේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙනි. ඒ අනුව ග්‍රාම නිලධාරීන් සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්ගේ කාර්ය භාරය පහත පරිදි වේ.

- ❖ ග්‍රාම නිලධාරීන් කාර්යාල වලට අනුයුක්ත කිරීම්
- ❖ දිස්ත්‍රික්කය තුළ ස්ථානමාරු කිරීම්
- ❖ සේවයේ ස්ථිර කිරීම්, උසස් කිරීම් සම්බන්ධව නිර්දේශ ලබා දීම
- ❖ ග්‍රාම නිලධාරී විශ්‍රාම ගැන්වීම් සඳහා නිර්දේශ ලබා දීම
- ❖ ග්‍රාම නිලධාරී භාෂා දීමනා ලබාදීම සඳහා නිර්දේශ ලබා දීම
- ❖ ග්‍රාම නිලධාරී ජීවදත්ත තොරතුරු පද්ධති පවත්වාගෙන යාම හා අනුමත සේවක සංඛ්‍යා හා පුරප්පාඩු වාර්තා ස්වදේශ කටයුතු ලේකම්ට ත්‍රෛයි මාසිකව වාර්තා කිරීම
- ❖ ග්‍රාම නිලධාරීන්ට එරෙහි මහජන පෙත්සම් ආශ්‍රිත රාජකාරි
- ❖ ග්‍රාම නිලධාරී කාර්යාල පරීක්ෂණ පිළිබඳ රාජකාරි

ආදිය වේ.

ජනතාවට ඵලදායී සේවාවක් සැපයීමේ අරමුණින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ග්‍රාම නිලධාරී කාර්ය සාධන තරඟ පැවැත්වීම සිදු කරයි.

ග්‍රාම නිලධාරී කාර්යාල කළමනාකරණයේදී පවුල් තොරතුරු සමීක්ෂණය කර ඒ සඳහා පොත් මුද්‍රණය කර, තොරතුරු පරිගණක ගත කිරීම හා එම තොරතුරු අන්තර් ජාලයට එකතු කිරීමද කරනු ලැබූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇත. උදාහරණයක් වශයෙන් තිහගොඩ ග්‍රාම නිලධාරී වසම් 40 තුල පවුල් තොරතුරු සමීක්ෂණය කර, එම තොරතුරු ඇතුලත් පොත් 40 ක් මුද්‍රණය කර ඇත. ආදර්ශයක් වශයෙන් අක්කර පනහ ග්‍රාම නිලධාරී කාර්යාලයේ මෙම ලේඛන සහ ගොනු පවත්වාගෙන යන අතර, ඒ සියල්ල පරිගණක ගතකර අන්තර් ජාලයට එකතු කර ඇත.

මේ ආකාරයට තරඟ සංවිධානය කිරීම තුලින් ජනතාවට කාර්යක්ෂම සේවාවක් සැපයීමට හැකිවී ඇත. මේ අනුව ජනතාව ආර්ථික අතින් සවිබල ගැන්වීම සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුව ආදියත් රාජ්‍ය නොවන සංවිධාන වල සහභාගීත්වයත් ඇතිව රබර් වගා කිරීමේ ව්‍යාපෘති, ඉඩම් වල සෝදාපාලුව වැලැක්වීම සඳහා අන්නාසි වගා ව්‍යාපෘති වැසිකිළි හා පානීය ජල අවශ්‍යතා සපුරා දීම් ආදී වශයෙන් විවිධාකාරවූ සහන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

- ❖ එමෙන්ම ජන සහන කඩිනම් සේවාවන් තෝරා ගත් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ක්‍රියාත්මක කර ඇත. (ග්‍රාම නිලධාරී කොට්ඨාශ වල පදිංචි ආබාධිත පවුල් පිළිබඳ විශේෂ අවධානය යොමු කර ඔවුන් නගාසිටුවීමට විධිමත් ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම, ජනතාවගේ ඉඩම් ගැටළු විසඳීම, ජාතික හැඳුනුම්පත් ලබා දීම, උප්පැන්න මරණ විවාහ සම්බන්ධ කටයුතු)
- ❖ සේවා පියස කාර්යාල හයක් ඉදි කිරීම,
- ❖ ග්‍රාම නිලධාරී වසම් වල සාමාජීය හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය සඳහා විවිධ වැඩසටහන් පැවැත්වීම,
- ❖ ඩෙංගු මර්දන වැඩසටහන යටතේ වසම් මට්ටමින් ශ්‍රමදාන පැවැත්වීම හා ගෘහස්ථ ඒකක මට්ටමින් ජනතාව දැනුවත් කිරීම.
- ❖ ගම නැගුම වැඩසටහන හා දිවි නැගුම වැඩසටහන යටතේ බීජ හා පැල, පොහොර, උපකරණ ආදිය ලබාදීම, කර්මාන්ත, සත්ත්ව කටයුතු හා ගෙවතු වගා පරීක්ෂා කටයුතු සඳහා සක්‍රීය දායකත්වය ලබා දීම.
- ❖ කඹුරුපිටිය කරගොඩ උයන්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ සිවිල් ආරක්ෂක කමිටු සම්බන්ධ කර ගනිමින් අඩු ආදායම්ලාභී පවුල් සඳහා වියළි සලාක ලබා දීම සහ අඩු ආදායම්ලාභී පවුලක් සඳහා ප්‍රජා දායකත්වයෙන් නිවසක් සකස් කර දීම.
- ❖ අකුරැස්ස නිමලව ප්‍රදේශයේ ආබාධිත පවුලක් සඳහා ප්‍රජා දායකත්වයෙන් නිවසක් ඉදිකර දීම සහ නිමලව නැගෙනහිර ප්‍රදේශයේ විහාරස්ථානයක් හා සංඝාවාසයක් ගොඩනැගීම.
- ❖ මාලිම්බඩ අකුරුගොඩ දකුණ රෝහන විශේෂිත පාසලට ග්‍රාම සංවර්ධන සමිතිය සමග එක්ව දිවා ආහාරය සහ පාසල් උපකරණ ලබා දීම සහ සිවිල් ආරක්ෂක කමිටුවේ සාමාජිකයන් හා එක්ව මානසික රෝගියෙකුගේ නිවසේ වහළ අලුත්වැඩියා කිරීම.
- ❖ මාලිම්බඩ කැකුණවෙල ග්‍රාම සේවා වසමෙහි භාෂා සංගමයක් පිහිටුවා දෙමළ භාෂා පන්තියක් වසම තුලට ලබා ගැනීම සහ ගැසට් නිවේදන,චක්‍රලේඛ, ප්‍රාදේශීය ලේකම්

කාර්යාලය මගින් ඉටු කරගත හැකි සේවාවන් හා ලියකියවිලි පිළිබඳ ජනතාව දැනුවත් කිරීම.

- ❖ මාලිම්බඩ සුල්තානගොඩ බටහිර ග්‍රාම නිලධාරී වසමෙහි සුල්තානගොඩ ක.විද්‍යාලයේ පැවති "ගුරු ගෙදරින් ගොවි ගෙදරට" අධ්‍යාපන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ පාසලට ඇතුලත් කර නොතිබූ දැරියන් පාසල්ගත කිරීම.

- ❖ අක්‍රීය ග්‍රාම සංවර්ධන සමිති ක්‍රියාකාරී මට්ටමට ගෙනඒම, ගැමි සෙත වැඩසටහන, ග්‍රාම සංවර්ධන සමිති ආරම්භ කිරීම, කාන්තා, වැඩිහිටි, යෞවන සමාජ, ක්‍රීඩා සමිති ආදියෙහි ක්‍රියාකාරීත්වය ඉහල නැංවීම. (යෞවන හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලබාදුන් ප්‍රතිපාදන වලින් නිවාසයක් නොමැති යෞවන සාමාජිකයෙකු සඳහා නිවසක් තනා දීමට සහාය දැක්වීම)

- ❖ සමාජ සේවා කටයුතු ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සිදු කරනු ලබන සියලුම සේවාවන් මෙහිදී සිදු කරන අතර, මෙයට අමතරව කාර්යාලයන්ට සම්බන්ධ සියළු ක්ෂේත්‍ර නිලධාරීන් තම අංශයට අදාල මහජන සේවාවන් සිදු කරනු ලබයි. ආයුර්වේද වෛද්‍ය සායන පැවැත්වීම මෙහිදී ජනප්‍රිය වැඩසටහනකි.

## 5.1.2 අභ්‍යන්තර විගණන රාජකාරි

2013 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක අභ්‍යන්තර විගණන පරීක්ෂණ පැවැත්විය යුතු වූ අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විගණන 06 ක් පැවැත්විය යුතු විය. ඒ අනුව 2013 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන 08 ක් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විගණන 06 ක් පවත්වා, අරමුණු කරගත් ඉලක්කය සපුරා ඇත. එසේම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පවත්වා ඇත. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ගෙවීම් වව්චර් පරීක්ෂා කර එම වාර්තා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ඉදිරිපත් කර ඇත.

### 5.1.3 ආදායම් එකතු කිරීම් කටයුතු

2013 වර්ෂයේ එකතු කරන ලද ආදායම

| ආදායම් ශීර්ෂය | විස්තරය | ආදායම් ගණන් දීමේ නිලධාරී | එකතු කල ආදායම |
|---|---|---|---|
| 10.02.07.00 | මුද්දර ගාස්තු | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | 20,000.00 |
| 10.03.07.02 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවට අදාල ලියාපදිංචි කිරීමේ ගාස්තු | රෙජිස්ට්‍රාර් ජනරාල් | 23,713,725.00 |
| 10.03.07.03 | පෞද්ගලික දැව ප්‍රවාහනය | වන සංරක්ෂක | 684,685.52 |
| 10.03.07.05 | රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට අදාල බලපත්‍ර ගාස්තු | ලේකම්, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය | 285,200.00 |
| 10.03.07.99 | බලපත්‍ර - අනෙකුත් | ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 4,646,659.57 |
| 20.02.01.01 | රජයේ ගොඩනැගිලි කුලී | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 837,124.59 |
| 20.02.01.03 | ඉඩම් හා අනෙකුත් බදු කුලී | ඉඩම් කොමසාරිස් | 1,100.00 |
| 20.02.02.99 | පොළිය - වෙනත් | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් | 7,362,726.28 |
| 20.03.02.13 | විභාග හා අනෙකුත් ගාස්තු | විභාග කොමසාරිස් ජනරාල් | 1,515,250.00 |
| 20.03.02.14 | මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු හා අනෙකුත් ලැබීම් | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් | 34,456,003.00 |
| 20.03.02.99 | විකුණුම් හා ගාස්තු - විවිධ | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 1,707,994.49 |
| 20.03.99.00 | විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම් | රේගු අධ්‍යක්ෂ ජනරාල්/ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | 766,767.69 |
| 20.04.01.00 | සමාජ සංරක්ෂණ දායක මුදල් - මධ්‍යම රජය | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | 30,559,388.93 |
| එකතුව | | | 106,556,625.07 |

## 5.1.4 මානව සම්පත් සංවර්ධනය හා වෘත්තීය මාර්ගෝපදේශ කටයුතු

ඵලදායිතා ලේකම් කාර්යාලයට අනුබද්ධිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවය කරන වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් හා මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරීන් විසින් ඵලදායී පුරවැසියෙකු ලෙස සමාජ ආර්ථික තත්වය නගා සිටුවීමට ජනතාවට අවශ්‍ය මගපෙන්වීම් සහ රැකියාගත කිරීම් කරනු ලබයි.

ක්‍රියාකාරී සැලැස්මට සමගාමීව වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන්ගේ 2013 වර්ෂයේ වැඩසටහන් පැවැත්වීමේ ඉලක්කය වැඩසටහන් 167 කි.ඒ අනුව 2013 වර්ෂය තුල සම්පූර්ණ කල වැඩසටහන් ගණන 175 කි. ඒ අනුව 2013 වසරේ ඉලක්කය පසු කර ඉදිරියට යාමට හැකියාව ලැබී ඇත. එම වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

| වැඩසටහන | 2013 වර්ෂය සඳහා ඉලක්කය | 2013 වසරේ සම්පූර්ණ කල වැඩසටහන් සංඛ්‍යාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රගතිය |
|---|---|---|---|---|
| පාසල් වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් | | | | |
| අ.පො.ස. (උ.පෙළ) | 48 | 48 | 1152 | 100% |
| අ.පො.ස.(සා.පෙළ) | 80 | 86 | 2080 | 108% |
| පාසල් හැර ගිය අය සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් | | | | |
| වෘත්තීය අභියෝග ජය ගැනීමේ වැඩසටහන | 04 | 04 | 122 | 100% |
| ස්වයං රැකියා සඳහා පෙලඹවීමේ වැඩසටහන | 05 | 05 | 162 | 100% |
| ගුරුවරු දැණුවත් කිරීමේ වැඩසටහන | 01 | 01 | 20 | 100% |
| උපාධිධාරී වැඩසටහන | 01 | 01 | 40 | 100% |
| රැකියා සමාජ වැඩසටහන | 04 | 04 | 127 | 100% |
| අවශ්‍යතා මත පුහුණු වැඩසටහන | 05 | 05 | 155 | 100% |
| ප්‍රාදේශීය රැකියාපොළ වැඩසටහන | 15 | 15 | 1280 | 100% |
| ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 01 | 01 | 30 | 100% |
| නිදහස් රැකියා පෙළඹවීමේ වැඩසටහන | 01 | 01 | 32 | 100% |
| පෞද්ගලික අංශයේ රැකියාගත කිරීමේ වැඩසටහන | 01 | 01 | 75 | 100% |
| ප්‍රධාන රැකියාපොල | 01 | 01 | 700 | 100% |
| පාවහන් නිෂ්පාදන වැඩසටහන | 0 | 01 | 25 | |
| ස්ක්‍රීන් ප්‍රින්ටින් වැඩසටහන | 0 | 01 | 25 | |

මානව සම්පත් සංවර්ධනය යටතේ සපයනු ලබන සේවාවන් පහත පරිදි වේ.

- අරමුණු සකසා ගැනීමට, කුසලතා සංවර්ධනයට, ධනාත්මක ආකල්ප සංවර්ධනයට මග පෙන්වීම.
- රැකියා අපේක්ෂකයින් ලියාපදංචි කිරීම.
- රැකියා පුරප්පාඩු හදුනාගෙන, රැකියා සපයන ආයතන ලියාපදිංචි කර රැකියා සඳහා සුදුසු අපේක්ෂකයින් ගැලපීම.

- දිස්ත්‍රික් රැකියාපොල පැවැත්වීම හා රැකියා සමාජ සංවිධානය.
- පුහුණුවීම් හා වෘත්තීය මාර්ගෝපදේශනය තුළින් රැකියා සඳහා යොමු කිරීම.
- ස්වයං රැකියා සඳහා යොමු කිරීම.

2013 වර්ෂයේ දිස්ත්‍රික් රැකියා සේවා මධ්‍යස්ථානය ඉටු කරනලද රාජකාරි

| වැඩසටහන | 2013 වසරේ ඉලක්කය | 2013 වසරේ ඉලක්කය සපුරාගත් ප්‍රමාණය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රගතිය |
|---|---|---|---|---|
| රැකියා සඳහා ලියාපදිංචි කිරීම | 1800 | 2768 | 2768 | 154% |
| රැකියා පුරප්පාඩු සංඛ්‍යාව | 600 | 635 | - | 106% |
| රැකියා ගැලපීම් සංඛ්‍යාව | - | 2346 | - | |
| සම්මුඛ පරීක්ෂණ සඳහා යොමු කිරීම් | 900 | 1800 | 1800 | 200% |
| රැකියාගත කිරීම් | 400 | 364 | - | 91% |
| වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් | - | 7 | 750 | |
| වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා යොමු කිරීම | - | 702 | 702 | |
| රැකියාපොළ වැඩසටහන් | - | 13 | 1496 | |
| රැකියා සමාජ වැඩසටහන් | - | 3 | 133 | |

### 5.1.5 ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු

2013 වර්ෂය තුල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කරන ඵලදායිතා සංවර්ධන සහකාර නිලධාරීන් විසින් දිස්ත්‍රික්කයේ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා විශාල දායකත්වයක් සපයා ඇත. ඒ අනුව ඵලදායිතාව හඳුන්වාදීම, 5S හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම, තත්ව කව වැඩසටහන සහ හරිත ඵලදායිතා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ පාසල් වැඩසටහන් 15, රාජ්‍ය ආයතන වල වැඩසටහන් 28, ප්‍රජා වැඩසටහන් 20 ක්ද පවත්වා ඇත. 2013 වර්ෂයේ හඳුන්වා දුන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ඵලදායිතාව හඳුන්වා දීමට ක්‍රියාත්මක කරන ලද "කයිසන් ව්‍යවසායකයෝ" වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසායකයින් 30 ක් සම්බන්ද කරගත් අතර, ඔවුන් සඳහා වැඩසටහන් 17 ක් පවත්වන ලදී. එසේම පෙර පාසල් සඳහා හඳුවන්වා දුන් පොඩිත්තන්ට 5S වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම තෝරාගත් පෙර පාසල් 12 බැගින් පෙර පාසල් 192 ක ගුරුවරුන්, පෙරපාසල් දරුදැරියන් සහ දෙමාපියන් සඳහා දැනුවත් කිරීම් සහ පසුවිපරම් කටයුතු සිදු කරන ලදී. දකුණු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන දක්ෂිණ සුව විරුවෝ ඵලදායිතා තරගය සඳහා ආයතන සූදානම් කිරීම සහ විනිශ්චය කටයුතු සඳහා සම්පත් දායකත්වය ලබාදීම සිදු කරන ලදී.

### 5.1.6 මාධ්‍ය සහ ප්‍රවෘත්ති කටයුතු

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය මගින් කරනු ලබන කාර්ය භාරය ඉමහත්ය. මාතර දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු සම්බන්ධව මහ ජනතාව දැනුවත් කිරීම සඳහා විවිධ අයුරින් කටයුතු කරන අතර ප්‍රධාන වශයෙන්ම ජනමාධ්‍ය වල වාර්තා නොවන සංවර්ධන ප්‍රවෘත්ති පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් ඒ පිළිබඳව රාජ්‍ය හා පෞද්ගලික ජනමාධ්‍ය සහ ජනමාධ්‍යවේදීන් දැනුවත් කරමින් ඒ සම්බන්ධව ඔවුන් වෙත තොරතුරු සැපයීම සිදු කරයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිල පුවත් වෙබ් අඩවිය වන www.news.lk වෙත මාතර දිස්ත්‍රික්කයේ තොරතුරු වාර්තා කිරීම සිදු කරයි.

දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ඔවුන් වෙනුවෙන් විවිධ සාකච්ජා, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම සිදු කරයි.

ජනමාධ්‍ය විෂය ක්ෂේත්‍රය සම්බන්ධව පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් තුළ දැනුම හා අවබොධය වැඩිදියුණු කිරීම උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල හා අධිකාරී ඇතුළු රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන මගින් මාතර දිස්ත්‍රික්කයේ සංවිධානය කරන විවිධ වැඩසටහන් වෙනුවෙන් ජනමාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.

ඒ අනුව 2013 වර්ෂයේ මාතර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව රාජ්‍ය හා පෞද්ගලික ජනමාධ්‍ය වෙත (www.news.lk ඇතුළුව) නිකුත් කරන ලද ප්‍රවෘත්ති නිවේදන සංඛ්‍යාව 142 කි.

දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ජනමාධවේදීන් 112 දෙනෙකු සඳහා " අපරාධ වාර්තාකරණයේදී ප්‍රාදේශීය ජනමාධ්‍ය වේදියාගේ කාර්ය භාරය" මැයෙන් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ දායකත්වයෙන් එක්දින වැඩමුළුවක් පවත්වන ලදී.

විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් මාතර දිස්ත්‍රික්කයේ පවත්වන ලද උත්සව, වැඩසටහන් හා වැඩමුළු ආදියෙහි වාර්තා කටයුතු සඳහා ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් යොමු කරමින් මාධ්‍ය සම්බන්ධීකරණය කිරීම් 18 ක් සිදු කර ඇත.

2013 වර්ෂයේ පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට සමගාමීව අධ්‍යාපන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පාසල් ළමුන් වෙනුවෙන් පරිගණක ආශ්‍රයෙන් පොදු රාජ්‍ය මණ්ඩලය හා සම්බන්ධ තොරතුරු මත පදනම්ව පවත්වන ලද මාර්ගගත තරඟය (online test) සඳහා මාතර දිස්ත්‍රික්කයේ සංවිධාන කටයුතු සිදු කරන ලදී. මේ සඳහා පාසල් 05 ක ළමුන් 100 ක් සහභාගී වූහ.

2013 පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුව හා ඊට සමගාමීව රටේ සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැණුවත් කිරීම සඳහා මාතර ප්‍රධාන බස් නැවතුම්පොළ ඉදිරිපිට පුළුල් තිර සජීවී විකාශයක් සහ වාර්තා වැඩසටහන් ප්‍රචාරය කිරීමෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත සිදු කරන ලදී.

## 5.1.7 ඡන්ද කටයුතු

මැතිවරණ කටයුතු වලදී තේරීම්භාර නිලධාරී වශයෙන් දිස්ත්‍රික් ලේකම් වෙත සුවිශාල කාර්යභාරයක් පැවරෙනු ඇත. මෙහිදී දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම් වරුන් හා දිස්ත්‍රික්කයේ මාණ්ඩලික නිලධාරීන් ඇතුලු සියලු රජයේ නිලධාරීන්ගේ දායකත්වය මේ සඳහා නොඅඩුව ලබා දෙනු ලැබේ.

මාතර දිස්ත්‍රික්කයේ මැතිවරණ කටයුතු මනාව සංවිධානය කොට පැවැත්වීමට පහත ක්‍රියාමාර්ග අනුගමනය කර ඇත.

- ❖ මැතිවරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා I.S.O. තත්ව කළමනාකරණ වැඩසටහන යටතේ හඳුන්වා දෙන ලද ක්‍රියාවලි නිර්මාණය කිරීම.
- ❖ උපායශීලී සැලසුම් සකස් කිරීම.
- ❖ මැතිවරණ කටයුතු වල නියැලෙන සෑම තරාතිරමකම නිලධාරීන් පුහුණු කිරීම.
- ❖ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන වල දැක්ම හා මෙහෙවර ප්‍රදර්ශනය කිරීම.
- ❖ සෑම මැතිවරණ ක්‍රියාකාරකමක් සඳහාම ශක්තිමත් කමිටු පිහිටුවීම.

### 5.1.8 පුද්ගල සහ ඉඩම් ලියාපදිංචිය

මාතර දිස්ත්‍රික්කයේ 2013 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16 හි පුද්ගල හා ඉඩම් ලියාපදිංචිය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| වර්ෂය තුල ලියාපදිංචි කල උප්පැන්න ගණන | 12522 |
| වර්ෂය තුල ලියාපදිංචි කල විවාහ ගණන | 7257 |
| වර්ෂය තුල ලියාපදිංචි කල මරණ ගණන | 4822 |
| වර්ෂය තුල ලියාපදිංචි කල ඔප්පු ගණන | 37 |

මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16 හි විවිධ ඉඩම් රාජකාරි කටයුතු වල ප්‍රගතිය පහත දැක්වේ.

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| ලබා දී ඇති ඉ.සං.ආ. බලපත්‍ර සංඛ්‍යාව | 472 |
| ලබා දී ඇති දීමනා බලපත්‍ර සංඛ්‍යාව | 397 |
| ලබා දී ඇති දීර්ඝ කාලීන බදුකර සංඛ්‍යාව | 35 |
| ඉඩම් කොමසාරිස් වෙත නිර්දේශ කර ඇති දීර්ඝ කාලීන බදුකර ගණන | 307 |
| නිකුත් කර ඇති ප්‍රජා ඔප්පු ගණන | 2 |
| පවත්වන ලද ඉඩම් කච්චේරි ගණන | 26 |
| පවත්වන ලද කොට්ඨාශ දින ගණන | 83 |
| ඒ අනුව වර්ෂය තුල ලබා දුන් මුළු ඉඩම් කට්ටි සංඛ්‍යාව | 6 |
| විසඳන ලද ඉඩම් ආරවුල් ගණන | 1199 |
| අනවසර නීත්‍යානුකූල කිරීම් සඳහා නිර්දේශ කළ සංඛ්‍යාව | 302 |
| ඒ යටතේ ලබා දුන් බලපත්‍ර ගණන | - |
| යවා ඇති මැනුම් නියෝග ගණන | 643 |
| ලැබී ඇති මැනුම් විස්තර ගණන | 416 |
| ඉවත් කරන ලද අනවසර කරුවන් ගණන | 55 |
| සන්තකය ආපසු ලබා ගැනීම සඳහා පවරනු ලැබුණු නඩු සංඛ්‍යාව | 43 |
| සන්තකය ආපසු ලබා ගැනීම සඳහා වර්ෂය තුල කටයුතු කළ ඉඩම් ගණන | 63 |

මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16 හි හැඳුනුම්පත් නිකුත් කිරීම් කටයුතු වල ප්‍රගතිය පහත දැක්වේ.

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| පු.ලි.දෙ. වෙත ඉදිරිපත් කර ඇති අයදුම්පත් ගණන | 20603 |
| ග්‍රා.නි. වරුන් මගින් මහජනයා වෙත නිකුත් කොට ඇති හැඳුනුම්පත් ගණන | 6147 |
| එක්දින සේවාවට ඉදිරිපත් කර ඇති හැඳුනුම්පත් ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව | 4570 |

### 5.1.9 ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම්

දිස්ත්‍රික්කය තුල ඇති වන හා ඇති විය හැකි ආපදා තත්වයන් සැලකිල්ලට ගනිමින් ඒ සඳහා අවශ්‍ය සියළුම ක්‍රියා මාර්ග ගැනීම අරමුණු කර ගනිමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල ආපදා කළමණාකරණ ඒකකය පිහිටුවා ඇත. ඒ අනුව දිස්ත්‍රික්කය තුල ව්‍යසන කළමනාකරණ කටයුතු සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා සුපරීක්ෂණ කටයුතු මේ මගින් කරනු ලබයි.

ඒ අනුව 2013 වර්ෂයේ ආපදා කළමනාකරණ කටයුතු සම්බන්ධව ප්‍රධාන කාර්ය භාරයන් පහත සඳහන් පරිදි වේ.

I හදිසි ප්‍රතිචාර දැක්වීම

- ❖ හදිසි ගිනි ගැනීම් මැඩ පැවැත්වීමට සහාය වීම සහ ඒ පිළිබඳ සොයා බැලීම.

II උවදුරු සහ අනතුරු තක්සේරුකරණය.

- ❖ වර්ෂාව හේතුවෙන් පැවති සුළං තත්වය නිසා අනාරක්ෂිත තත්වයේ පවතින නිවාස පිළිබඳ පරීක්ෂා කිරීම හා ඔවුන් දැනුවත් කිරීම.
- ❖ නාය යෑමට ලක්ව ඇති ප්‍රදේශ පිළිබඳ පරීක්ෂා කිරීම.
- ❖ නිවෙස් මතට ගස් කඩා වැටීම නිසා සිදුවූ හානි පිළිබඳ පරීක්ෂා කිරීම හා අදාල නිවැසියන් දැනුවත් කිරීම.
- ❖ අනතුරුදායක පස් කඳු පිළිබඳ පරීක්ෂා කිරීම සහ අධික වර්ෂාව හේතුවෙන් පස් කඳු කඩා වැටීම් හා හානියට පත් නිවාස පරීක්ෂා කිරීම

III ආපදා පෙර සූදානම් කටයුතු .

- ❖ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්/ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හා රාජ්‍ය ආයතන නිලධාරීන් සඳහා ආපදා කළමනාකරණය පිළිබඳ දේශන පැවැත්වීම.

- ❖ ආපදා කළමනාකරණ කමිටු පිහිටුවීම.
- ❖ ගිනි නිවාරණය පිළිබඳ පාසල් සිසුන්, රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම.
- ❖ ඩෙංගු මර්ධනය පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කිරීම.
- ❖ ඩෙංගු මර්ධනය පිළිබඳව ගෙයින් ගෙට ගොස් ප්‍රජාව දැනුවත් කිරීම.
- ❖ කිඹුල් තර්ජනය පිළිබඳ නිල්වලා ගඟ දෙපස ප්‍රජාව ජන ඇමතුම් කට්ටල මගින් දැනුවත් කිරීම

IV ප්‍රාදේශීය ආපදා පෙර සූදානම් සැලැස්ම සකස් කිරීම.

- ❖ ග්‍රාමීය ආපදා පෙර සූදානම් සැලැස්ම සකස් කිරීම

V ආපදා පෙර සූදානම් සඳහා මෙවලම්, භාණ්ඩ, උපකරණ ලබා දීම

VI ආපදා අවම කිරීම් කටයුතු

- ❖ සුනාමි රළ බලපානු ලබන කලාපය තුළ විදුලි සයිරන් නලා සංඥා පද්ධතියක් ස්ථානගත කිරීම.
- ❖ කිඹුල් තර්ජනය මර්ධනය කිරීම සඳහා ආරක්ෂිත නාන තොටුපල III අදියර යටතේ ආරක්ෂිත නාන තොටුපලවල් 10 ක් ඉදි කිරීම.
- ❖ කිඹුල් තර්ජන අවම කිරීම සඳහා නිල්වලා ගඟ දෙපස තෝරා ගත් ස්ථාන 50 ක් සඳහා දැණුවත් කිරීමේ නාම පුවරු ස්ථාපනය කිරීම.
- ❖ වර්ෂා ජලයෙන් වන හානි වැලැක්වීමට කාණු පද්දධතියක් ඉදි කිරීම (දෙවිනුවර - ගන්දර මධ්‍යම)
- ❖ දියේ ගිලීම් අවම කර ගැනීම සඳහා දැණුවත් කිරීමෙ ප්‍රදර්ශන පුවරු 04 ක් ස්ථාපිත කිරීම.
- ❖ සෝදිසි කිරීම හා ජීවිත බේරා ගැනීම පිළිබඳ තෙදින පුහුණු වැඩසටහනක් පැවැත්වීම (මාතර - පොල්හේන)
- ❖ දියේ ගිලීම් අවම කර ගැනීම සඳහා දැණුවත් කිරීමෙ ප්‍රදර්ශන පුවරු 04 ක් ස්ථාපිත කිරීම.
- ❖ සෝදිසි කිරීම හා ජීවිත බේරා ගැනීම පිළිබඳ තෙදින පුහුණු වැඩසටහනක් පැවැත්වීම (මාතර - පොල්හේන)
- ❖ අභ්‍යාසලාභී උපාධිධාරීන් සඳහා ප්‍රථමාධාර පුහුණු වැඩසටහනක් පැවැත්වීම (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)
- ❖ ග්‍රාමීය ආපදා කළමනාකරණ කමිටු සාමාජිකයින් සඳහා කඳවුරු කළමනාකරණය සහ ප්‍රථමාධාර පිළිබඳව ප්‍රායෝගික පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ❖ පාසල් ළමුන් සඳහා ජීවිතාරක්ෂක හා ප්‍රථමාධාර පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

- ❖ දෙනියාය තේ පර්යේෂණ ආයතනයේ තේ වතු ආශ්‍රිතව සිදු වන නායයෑම් තත්වයන් පරීක්ෂා කිරීම හා නායකත්වය, තීරණ ගැනීමේ හැකියාව, ආත්ම විශ්වාසය වර්ධනය කර ගැනීම පිළිබඳව දෙදින ප්‍රායෝගික පුහුණු වැඩසටහන පැවැත්වීම.

VII සම්බන්ධීකරණ රැස්වීම්, සම්මන්ත්‍ර සහ අනෙකුත් ක්‍රියාකාරකම්.

## 5.2 සමාජ සේවා සහ සංස්කෘතික ප්‍රගතිය

### 5.2.1 සංස්කෘතික සහ ආගමික ක්‍රියාකාරකම්

#### 5.2.1.1 සංස්කෘතික ක්‍රියාකාරකම්

මාතර දිස්ත්‍රික්කයේ සංස්කෘතික ප්‍රවර්ධනය, සංරක්ෂණය හා ව්‍යාප්තිය සඳහා කටයුතු කරමින් 2013 වර්ෂය තුල සුවිශාල කාර්යභාරයක් ඉටු කිරීමට සමත්වී ඇත. ඒ අනුව ඉටු කල කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- ❖ ජාතික නිදහස් උළෙල පැවැත්වීම හා නිදහස් දිනය නිමිත්තෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පිරිත් පිංකම පැවැත්වීම සහ හීල් දානය පිරිනැමීම
- ❖ වෙසක් සීල භාවනා වැඩසටහන්, වෙසක් පොහොය දිනට පෙර දින ධර්ම දේශනා වැඩසටහන් සහ දන්සැල් පැවැත්වීම.
- ❖ දහම් පාසල්, ප්‍රාදේශීය, දිස්ත්‍රික්, සමස්ථ ලංකා සිසු නිපුනතා ඇගයීම් පැවැත්වීම හා තරඟ සඳහා දරුවන් යොමු කිරීම.
- ❖ දහම් පාසල් ගුරුවරු සඳහා පැවැත්වෙන ඩිප්ලෝමා පාඨමාලාවට ගුරුවරු යොමු කිරීම හා දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ❖ විහාරස්ථාන හා දහම් පාසල් සඳහා උපකරණ ලබා දීම.
- ❖ ගවයන් නිදහස් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ❖ දේශීය ආහාර සංස්කෘතික ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වීම.
- ❖ දිස්ත්‍රික් සාහිත්‍ය උළෙල හා ප්‍රාදේශීය සාහිත්‍ය උළෙල පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැලැස්වීම.
- ❖ මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන පැවැත්වීම.
- ❖ පෙරහැර සංවිධානය (තොටමුණ ජයමහා විහාර පෙරහැර, වැව්රුකන්නල බුදුරජ මහ වෙහෙර පෙරහැර)
- ❖ දිස්ත්‍රික්කයේ පැවැත්වෙන ජාතික ආගමික සංස්කෘතික වටිනාකමක් ඇති උත්සව සංවිධානය කිරීම.

### 5.2.1.2 ආගමික ක්‍රියාකාරකම්

බුදු දහමේ අනන්‍යතාවය ආරක්ෂා කරමින් අන්‍ය ආගමික සහජීවනයක් ඇති කරමින් සමස්ථ ජාතියේම ආගමික ප්‍රබෝධයක් ඇති කරලීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින බෞද්ධ කටයුතු අංශය මගින් සිදු කරනු ලබයි. ඒ අනුව 2013 වර්ෂය තුළ කල කාර්යභාරය පහත සඳහන් වේ.

- දිස්ත්‍රික් දහම් පාසල් සිසු නිපුණතා ඇගයීම් කටයුතු සංවිධානය හා අධීක්ෂණය කිරීම.
- දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- දිස්ත්‍රික් දහම් පාසල් සිසු නිපණතා සහ සමස්ත ලංකා දහම් පාසල් සිසු නිපුණතා ඇඟයීම.
- පන්සලෙන් ගමට ඔසු උයන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
- සසුනෙන් සෙවන නිවාස ව්‍යාපෘතිය ඇරඹීම.
- දහම් පාසල් හා විහාර සංවර්ධන ආධාර ලබා දීම.
- දහම් සරසවිය ඩිප්ලෝමා පාඨමාලා කටයුතු සංවිධානය, පාලි භාෂා පාඨමාලා කටයුතු සංවිධානය කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සංවිධානය කරන සියලු ආගමික උත්සව හා වැඩසටහන් සංවිධානය කිරීම.

### 5.2.2 ළමා ආරක්ෂණ ක්‍රියාකාරකම්

දිනෙන් දින වැඩි වන ළමා අපයෝජන වැලැක්වීම සඳහා විශාල කාර්ය භාරයක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 මගින් කරනු ලබයි. එමෙන්ම අපයෝජනයන්ට ලක් වූවන් ආරක්ෂා කිරීම සහ ප්‍රතිකාර කිරීමද කරනු ලබයි. ඒ අනුව ළමා ආරක්ෂණය සම්බන්ධව 2013 වර්ෂයේ කරන ලද කාර්ය භාරය පහත සඳහන් පරිදි වේ.

- ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කාන්තා සමිති හා ක්‍රියාකාරී සිවිල් සංවිධාන සාමාජිකයින් හා ප්‍රජාව 900 කගේ සහභාගීත්වයෙන් ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීම් වැඩසටහන් 9 ක් පවත්වා ඇත.
- පාසල් 80 ක උපදේශන ගුරුවරුන් සහභාගී කරවාගෙන පාසල තුල ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ගුරු සිසුන් 275 සහභාගී කරවාගෙන පාසල තුල ළමා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- ළමා අපයෝජන පිළිබඳව ගැබිණි මව්වරුන් පියවරුන් හා සෞඛ්‍ය නිලධාරීන් 360 දෙනෙකු සහභාගී කරවාගෙන වැඩසටහන් 6 ක් පැවැත්වීම.
